## 2.7 මහාපජාපති ගොතමී අපදානය

226. ලොවට පහනක් වූ වෙනෙය්‍යජන දමනයෙහි සාරථී වූ බුදුරජාණන් වහන්සේ එක්සමයෙකැ විශාලා මහනුවර මහාවනයෙහි මැනවින් කරන ලද කූටාගාර ශාලායෙහි වැඩ වසන සේකැ.



227. තදා ජිනස්ස මාතුච්ඡා මහාගොතමී භික්ඛුනී,
තහිං කතෙ[1] පුරෙ රම්මෙ වසී භික්ඛුනුපස්සයෙ.

228. භික්ඛුනීහි විමුත්තාහි සතෙහි සහ පඤ්චහි,
රහොගතාය තස්සෙවං චිත්තස්සාසි[2] විතක්කිතං.

229. "බුද්ධස්ස පරිනිබ්බාණං සාවකග්ගයුගස්ස වා
රාහුලානන්දනන්දානං නාහං ලච්ඡාමි පස්සිතුං*

230. පටිගච්චායුසඞ්ඛාරෙ[3] ඔස්සජ්ජිත්වාන[4] නිබ්බුතිං,
ගච්ඡෙය්‍යං ලොකනාථෙන අනුඤ්ඤාතා මහෙසිනා."

231. තථා පඤ්චසතානම්පි භික්ඛුනීනං විතක්කිතං,
ආසි ඛෙමාදිකානම්පි එතදෙව විතක්කිතං.

232. භූමිචාලො තදා ආසි නාදිතා දෙවදුන්දුභි,
උපස්සයාධිවත්ථායො දෙවතා සොකපීළිතා.
විලපන්තා සකරුණං[5] තත්ථස්සූනි පවත්තයුං,

233. මිත්තා[6] භික්ඛුනියො තා හි උපගන්ත්වාන ගොතමිං
නිපච්ච සිරසා පාදෙ ඉදං වචනමබ්‍රවිං:

234. "තත්ථ තොයලවාසිත්තා මයමය්‍යෙ රහොගතා
සාචලා චලිතා භූමි නාදිතා දෙවදුන්දුභි,
පරිදෙවා ච සුය්‍යන්ති කිමත්ථං නූන ගොතමී."

235. තදා අවොච සා සබ්බං යථාපරිවිතක්කිතං,
තායොපි සබ්බා ආහංසු යථාපරිවිතක්කිතං.

236. "යදි තෙ රුචිතං අය්‍යෙ නිබ්බාණං පරමං සිවං,
නිබ්බායිස්සාම සබ්බාපි බුද්ධානුඤ්ඤාය සුබ්බතෙ.

237. මයං සහාව නික්ඛන්තා ඝරාපි ච භවාපි ච
සහයෙව ගමිස්සාම නිබ්බාණපුරමුත්තමං."

238. නිබ්බානාය වජන්තීනං කිං වක්ඛාමීති" සා වදං
සහ සබ්බාහි නිග්ගච්ඡි භික්ඛුනීනිලයා තදා.

---

1. තහිං යෙව - ස්‍යා
2. චිත්තස්සාපි - මජ්සං.
3. පටිකච්චායුසඞ්ඛාරං - මජ්සං.,
4. විසජ්ජිත්වාන - මජ්සං.
5. සුකරුණං - මජ්සං.
6. සබ්බා - ස්‍යා, PTS

* ඉමිස්සා ගාථායානන්තරං "සිමු, මජ්සං." පොත්ථකෙසු
"බුද්ධස්ස පරිනිබ්බාණං සාවකග්ගයුගස්ස ච
මහාකස්සපනන්දානං ආනන්දරාහුලාන ච:' අයම්පි ගාථා දිස්සතෙ,
න ස්‍යාම පොත්ථකෙසු.

http://www.dhammikaweb.com/

227—228. එකල්හි ජිනෙන්ද්‍රයන් වහන්සේගේ සුළුමවූ වූ මහා පජාපති ගෞතමී තෙරණියෝ ඒ නගරයෙහි කරන ලද රම්‍ය වූ මෙහෙණවරෙහි කෙලෙසුන්ගෙන් මිදුණු (–රහත්) මෙහෙණන් පන් සියයක් සමග වාසය කළහ. විවේකී වැ හුන් ඔවුනට මෙබඳු මනොසංකල්පයෙක් පහළ වියැ.

229. “ මම බුදුරදුන්ගේ පිරිනිවීම හෝ දෙ අගසව්වන් වහන්දැගේ පිරිනිවීම හෝ රාහුල – ආනන්ද –නන්ද තෙරණුවන්ගේ පිරිනිවීම හෝ දක්නට නො ලබමි.

230. ලෝකනාථ වූ මහර්ෂීන් වහන්සේ විසින් අනුදන්නා ලදු වැ කල් ඇති වැ ආයුසංස්කාරයන් හැර පියා නිවීමට යන්නෙම් නම් මැනැවි.”

231. පන්සියයක් මෙහෙණන්හට ද එබඳු ම විතර්කයෙක් වියැ, ඛෙමාදි තෙරණිවරුනට ද තෙල විතර්කයම වූයේ යැ.

232. එකෙණෙහි මහපොළොව කම්පිත වියැ, මෙසගර්ජනා ද වූයේ යැ. මෙහෙණවරට අරක්ගත් දේවතාවෝ ශෝකයෙන් පෙළුණාහු වැලපෙමින් කඳුළු වැගිරවූහු.

233. ඒ (ගෞතමී තෙරණිය හා) මිත්‍ර මෙහෙණෝ ද ගෞතමිය වෙතැ එළැඹැ පා මත සිරසින් වැඳ වැටී මෙවදන් බිණූහු:

234. “ආයඖවනි, දිය පොදකින් (සිය සිරුරු) තෙමාගත් අපි එහි රහොගත (–එකලා) වූම්හ. ඒ අචල වූ පොළොව සැලිණ, මෙසයෝ ගර්ජනා කළහ, වැලපීම් ද ඇසෙයි, ගෞතමී උත්තමාවනි, එකැතින් (මේ) කුමක් සඳහා ද ?”

235. එවිට ඕ යම් අයුරකින් විතර්කකරනලද නම් සියල්ල කීවා යැ. ඒ සියලු මෙහෙණෝ ද (තමන්) විතර්කකළ අයුරු (එලෙසින් ම) කීහු.

236. “ආයඖවෙනි, පරම ශාන්ත වූ නිවන ඉදින් ඔබට රිසි නම් මනා ව්‍රත ඇති උත්තමාවනි, (අපි) සියල්ලෝ ද බුද්ධානුඥයෙන් පිරිනිවෙන්නමු.

237. අපි එක් වැ ම ගෙයිනුදු භවයෙනුදු නික්මුණෝ වම්හ උතුම් නිවන්පුරයට එක්වැ ම යන්නමු.”

238. එවිටැ ඕ තොමෝ (ගෞතමී) “නිවනට යන්නන්හට කුමක් කියම් ද” යි පවසමින් සියල්ලන් සමග මෙහෙණවරින් බැහැර වැ ගියා යැ.



http://www.dhammikaweb.com/

239. උපස්සයෙ යාධිවත්ථා දෙවතා තා ඛමන්තු මෙ,
භික්ඛුනීනිලයස්සෙදං පච්ඡිමං දස්සනං මම.

240. න ජරා මච්චු වා යත්ථ අප්පියෙහි සමාගමො,
පියෙහි විප්පයොගො’ත්ථි[1] තං වජිස්සං[2] අසඞ්ඛතං.

241. අවීතරාගා තං සුත්වා වචනං සුගතොරසා,
සොකට්ටා පරිදෙවිංසු “අහො නො අප්පපුඤ්ඤතා.

242. භික්ඛුනීනිලයො සුඤ්ඤො භූතො තාහි විනා අයං,
පභාතෙ විය තාරායො න දිස්සන්ති ජිනොරසා.

243. නිබ්බානං ගොතමී යාති සතෙහි සහ පඤ්චහි,
නදීසතෙහිව සහ ගඞ්ගා පඤ්චහි සාගරං.

244. රථිකාය වජන්තිං තං[3] දිස්වා සද්ධා උපාසිකා,
ඝරා නික්ඛම්ම පාදෙසු නිපච්ච ඉදමබ්‍රවුං:

245. “පසීදස්සු මහාභොගෙ අනාථායො විහාය නො,
තයා න යුත්තං[4] නිබ්බාතුං” ඉච්චට්ටා[5] විලපිංසු තා.

246. තාසං සොකපහාණත්ථං අවොච මධුරං ගිරං,
“රුදිතෙන අලං පුත්තා හාසකාලො’යමජ්ජ වො.

247. පරිඤ්ඤාතං මයා දුක්ඛං දුක්ඛහෙතු විවජ්ජිතො,
නිරොධො මෙ සච්ඡිකතො මග්ගො චාපි සුභාවිතො.

(භාණවාරං පඨමං)

248. පරිචිණ්ණො මයා සත්ථා කතං බුද්ධස්ස සාසනං,
ඔහිතො ගරුකො භාරො භවනෙත්ති සමූහතා.

249. යස්සත්ථාය පබ්බජිතා අගාරස්මානගාරියං,
සො මෙ අත්ථො අනුප්පත්තො සබ්බසංයොජනක්ඛයො.

250. බුද්ධො තස්ස ච සද්ධම්මො අනූනො යාව තිට්ඨති,
නිබ්බාතුං තාව කාලො මෙ මා මං සොචථ පුත්තිකා.

---

1. පියෙහි න වියොගො’පි – මජසං.
2. වජ්ජිසං – සයා.
3. වජන්තියා – මජසං.
   වජන්තිනං – PTS
4. යුත්තා – මජසං
5. ඉච්ඡට්ටා – මජසං, සයා
   ඉච්චවචා – PTS

Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

239. "මෙහෙණවර අරක්ගත් යම් දෙවිකෙනෙක් වෙත් නම් උහු තුමූ මට ක්‍ෂමා කෙරෙත් වා. මෙහෙණවර මේ මාගේ පශ්චිම දර්ශනයයි.

240. යම් තෙනෙකැ ජරා වේවයි, මරණ වේවයි, අප්‍රියසම්ප්‍රයොග වේවයි, ප්‍රියවිප්‍රයෝග වේවයි නැත්ද අසංස්කෘත වූ (–ප්‍රත්‍යයෙන් සකස් නොවූ) එතැනට යන්නෙමි." යි (කිවූ.)

241. නො රහත් බුද්ධපුත්‍රයෝ එ වදන් අසා සොවින් පෙළුණාහු "අහෝ, අපගේ මඳපින් ඇතිබවැ" යි වැලපුනාහු යි.

242. ඔවුන්ගෙන් වෙන් වැ මේ භික්ෂුණී ආරාමය හිස් වියැ, සූර්‍යෝදයයෙහි තාරකා මෙන් බුද්ධපුත්‍රී (භික්‍ෂුණී) හු නො පැණෙත්.

243. ගඞ්ගා නදිය පන්සියයක් නදීන් සමග සයුරට වදනාසේ මහාපජාපති ගොතමී පන්සියයක් මෙහෙණන් සමග නිවනට යෙයි.

244. වීර්‍යයෙහි වඩනා ඇය දක සැදැහැ ඇති උවැසියෝ ගෙයින් නික් මැ පා මතුයෙහි වැඳ හෙවැ මෙ වදන් බිණූහු.

245. "මහාභාග්‍යවත් උත්තමාවනි, (අප කෙරෙහි) පහදිනු මැනැවි. අනාථ වූ අප හැර පියා ඔබ පිරිනිවන්නට යුතු නැතැ" යි ඔහු මහත්සේ හඬ නගා වැලපුනාහ.

246. ඔවුන්ගේ ශෝකප්‍රහාණය සඳහා (ගොතමී තොමෝ) මිහිරි වදන් පැවසූ යැ: "දරුවෙනි, හැඬීමෙන් කම් නැත, තොපට අද මෙ සිනාසීමට කාලයයි.

247. මා විසින් දුක පිරිසිඳ දක්නා ලද යැ, දුකට හේතුව දුරු කරන ලද යැ මා විසින් දුඃඛ නිරොධය පසක් කරන ලද යැ, මාර්ගය ද මැනැවින් වඩනා ලද වෙයි.

(පළමු බණවර යි)

248. මා විසින් ශාස්තෘන් වහන්සේ ඇසුරු කරන ලදහ, බුදුසසුන් කොට නිමවන ලද, ස්කන්ධභාරය බහාලන ලද, තෘෂ්ණාව මුලිනුපුටා නසන ලදී.

249. යම් අර්ථයක් සඳහා ගිහිගෙන් නික්මැ බුදුසසුන්හි පැවිදි වූයෙම් ද, සියලු සංයෝජනයන්ගේ ක්‍ෂයයවූ ඒ අර්ථය මා විසින් අනුප්‍රාප්තයි.

250. බුදුරජාණන් වහන්සේත් ඔබගේ අනූන වූ සද්ධර්මයත් යම්තාක් සිටුනා සේක් ද ඒතාක් පිරිනිවෙන්නට මට කාලය වෙයි. දියණියනි, මා ගැන සෝක නොකරව.



http://www.dhammikaweb.com/

251. කොණ්ඩඤ්ඤානන්දනන්දාදී තිට්ඨන්ති රාහුලො ජිනො,
සුඛිතො සහිතො සඞ්ඝො හතදප්පා ච තිත්ථියා.

252. ඔක්කාකවංසස්ස යසො උස්සිතො මාරමද්දනො,
නනු සම්පති කාලො මෙ නිබ්බානත්ථාය පුත්තිකා.

253. චිරප්පභූති යං මය්හං පත්ථිතං අජ්ජ සිජ්ඣතෙ,
ආනන්දභෙරිකාලො'යං කිං වො අස්සූහි පුත්තිකා.

254. සචෙ මයි දයා අත්ථි යදි චත්ථි කතඤ්ඤුතා,
සද්ධම්මට්ඨිතියා සබ්බා කරොථ විරියං දළ්හං.

255. ථීනං අදාසි පබ්බජ්ජං සම්බුද්ධො යාචිතො මයා,
තස්මා යථා'හං නන්දිස්සං තථා තමනුතිට්ඨථ.

256. තා එවමනුසාසිත්වා භික්ඛුනීහි පුරක්ඛතා,
උපෙච්ච බුද්ධං වන්දිත්වා ඉදං වචනමබ්‍රවි:

257. "අහං සුගත මාතා තෙ[1] ත්වං ච වීර පිතා මම,
සද්ධම්මසුඛදෙ[2] නාථ තයා ජාතම්හි[3] ගොතම.

258. සංවඩ්ඪිතො'යං[4] සුගත රූපකායො මයා තව,
අනින්දියො[5] ධම්මකායො[6] මම සංවඩ්ඪිතො[4] තයා.

259. මුහුත්ත[7]තණ්හාසමනං ඛීරං ත්වං පායිතො මයා,
තයා'හං සන්තමච්චන්තං ධම්මඛීරං හි[8] පායිතා.

260. වද්ධනරක්ඛනෙ[9] මය්හං අනණො[10] ත්වං මහාමුනෙ,
පුත්තකාමා ථියො යා තා[11] ලභන්තු[12] තාදිසං සුතං,

261. මන්ධාතාදිනරින්දානං යා මාතා සා භවණ්ණවෙ,
නිමුග්ගා'හං තයා පුත්ත තාරිතා භවසාගරා.

262. රඤ්ඤො මාතා මහෙසීති සුලභං නාමමිත්ථිනං,
බුද්ධමාතාති යං නාමං එතං පරමදුල්ලභං.

263. තඤ්ච ලද්ධං මයා වීර පණිධානං මමං තයා,
අණුකං වා මහන්තං වා තං සබ්බං පූරිතං මයා.

---

1. තෙමාතා – සබෙබපු.
2. සද්ධම්මසුඛද – මජසං
3. ජාතාම්හි – මජසං.
4. සංවද්ධිතොයං – මජසං.
5. අනින්දිතො – මජසං., ආනන්දියො – ස්‍යා.
6. ධම්මතනු – සීමු, PTS
7. මුහුත්තං – මජසං.
8. ධම්මඛීරම්පි – ස්‍යා.
9. බන්ධනාරක්ඛනෙ – මජසං.
10. අණණො – මජසං.
11. ගාවං – මජසං.
12. ලභන්ති – මජසං, ස්‍යා, පෙථි.

Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

251. කොණ්ඩඤ්ඤ – ආනන්ද – නන්ද ආදි තෙරණුවෝ ද, ජිනපුත්‍ර රාහුල තෙරහු ද සිටුනාහ. සඞ්ඝ තෙමේ සුඛිත යැ සහිත යැ තීර්ත්‍ථිකයෝ නැසුණු දර්ප (–මාන) ඇත්තාහු යි.

252. ඔක්කාක වංසයේ මරුන් මඩනා යශස උස්වැ නැගැ සිටියේ යැ, දූරියනි, නිවන් සඳහා මාහට දූන් කාලය නො වන්නේ ද ?

253. බොහෝ කලෙකැ සිට මා විසින් යමක් පතන ලද නම් එය අද සිද්ධ වෙයි, මෙ වනාහි සන්තෝෂජනක භේරිවාදනයට කාලයයි. දූරියනි, තොපගේ කඳුළින් කවර වැඩෙක් ද ?

254. ඉදින් මා කෙරෙහි දයාවෙක් ඇත් නම් කෘතඥතාවෙක් ඇත් නම් (තෙපි) සියල්ලෝ සද්ධර්මස්ථිතිය සඳහා දැඩි වීර්‍ය්‍යය කරව.

255. මා විසින් අයදනා ලද බුදුරජාණන් වහන්සේ මාගමුන්ට ප්‍රව්‍රජ්‍යාව දුන්සේකැ, එහෙයින් යම්සේ මම සතුටු වන්නෙම් නම් එසේ ඒ අනු වැ (තෙපි ද) සිටුව ” යි.

256. ඔවුනට මෙසේ අනුශාසනා කොට මෙහෙණන් විසින් පෙරටු කරන ලද්දී බුදුරදුන් වෙතැ එළැඹැ වැඳ මෙ වදන් පැවසූ යැ :

257. “ සුගතයන් වහන්ස, මම ඔබගේ මවු වෙමි, වීරයන් වහන්ස, ඔබ ද මාගේ පියා වෙති. නාථයන් වහන්ස, (ඔබ මට) සදහම් සුව දුන්හ, ගෞතමයන් වහන්ස, ඔබ වෙතින් (මම) උපන්නෙම් වෙමි.

258. සුගතයන් වහන්ස, ඔබගේ රූ කය මා විසින් වඩන ලද යැ, මාගේ අනින්ද්‍යනීය දහම් කය ඔබ විසින් වඩන ලදී.

259. මා විසින් ඔබ මොහොතක් (සා) පිපාසා සන්හිඳුවන කිරි පොවන ලදහු, මම ඔබ විසින් අත්‍යන්ත ශාන්ත වූ දහම් නැමැති කිරි පොවන ලද වෙමි.

260. මහාමුනිවරයාණනි, මා විසින් වැඩීමෙහි රැකීමෙහි ලා ඔබ ණයගැති නො වෙති. පුතුන් කැමැති යම් ස්ත්‍රීහු වෙත් නම් ඔහු ඔබ බඳු පුතකු ලබත්වා.

261. මන්ධාතු ආදි රජුන්ගේ යම් මවක් වූ නම් ඕ බවසයුරෙහි ගිලුණා යැ. පුත්‍රයාණනි, ඔබ විසින් (මම) බවසයුරෙන් තරණය කරන ලද වෙමි.

262. ‘ රාජ මාතා – රාජ මහෙසී ’ යන නම ස්ත්‍රීන්හට සුලභ යැ, *බුද්ධමාතා ’ යි යම් නාමෙක් ඇද්ද, තෙල නම පරම දුර්ලභයි.

263. මාගේ ඒ ප්‍රණිධිය ද ඔබ වෙතින් මා ලද යැ, කුඩා වේවයි. මහත් වේවයි ඒ සියලු කිස මා විසින් පුරණ ලදී.



http://www.dhammikaweb.com/

264. පරිනිබ්බාතුමිච්ඡාමි විහායෙමං කලෙබරං,[1]
අනුජානාහි මෙ වීර දුක්ඛන්තකර නායක.

265. චක්කඞ්කුසධජාකිණ්ණෙ පාදෙ කමලකොමලෙ,
පසාරෙහි පණාමං තෙ කරිස්සං පුත්තපෙමසා.[2]

266. සුවණ්ණරාසිසංකාසං සරීරං කුරු පාකටං,
කත්වා දෙහං සුදිට්ඨං තෙ සන්තිං ගච්ඡාමි නායක.''

267. ද්වත්තිංසලක්ඛණූපෙතං සුප්පභාලඞ්කතං තනුං
සඤ්ඤාසනාව බාලක්කං මාතුච්ඡං දස්සයී ජිනො.

268. ඵුල්ලාරවින්දසඞ්කාසෙ තරුණාදිච්චසප්පභෙ,
චක්කඞ්කිතෙ පාදතලෙ තතො සා සිරසා පති.

269. ''පණමාමි නරාදිච්චං ආදිච්චකුලකෙතුකං,
පච්ඡිමෙ මරණෙ[3] මය්හං න තං ඉක්ඛාමහං පුනො.

270. ඉත්ථියො නාම ලොකග්ග සබ්බදොසකරා මතා,
යදි කො චත්ථි දොසො මෙ ඛමස්සු කරුණාකර.

271. ඉත්ථිකානඤ්ච පබ්බජ්ජං යමහං[4] යාචිං පුනප්පුනං,
තත්ථ චෙ අත්ථි දොසො මෙ තං ඛමස්සු නරාසභ.''

272. මයා භික්ඛුනියො වීර තවානුඤ්ඤාය සාසිතා,
තත්‍ර චෙ අත්ථි දුන්නීතං තං ඛමස්සු ඛමාධිප.[5]

273. ''අක්ඛන්තෙ නාම ඛන්තබ්බං කිං භවෙ ගුණභූසනෙ,
කිමුත්තරං තෙ වක්ඛාමි නිබ්බානාය වජන්තියා.

274. සුද්ධෙ අනූනෙ මම භික්ඛුසඞ්ඝෙ
ලොකා ඉතො නිස්සරිතුං කමන්තෙ,[6]
පභාතකාලෙ ව්‍යසනං ගහානං[7]
දිස්වාන නිය්‍යාති ච චන්දලෙඛා.

275. තදෙතරා භික්ඛුනියො ජිනග්ගං
තාරාව චන්දානුගතා සුමෙරුං,
පදක්ඛිණං කත්වා නිපච්ච[8] පාදෙ
ඨිතා මුඛන්තං සමුදික්ඛමානා.

1. කලෙවරං – මජසං
2. පුත්ත උත්තමෙ - මජසං පුත්තපෙමහං – සයා
3. සරණං – සයා
4. යං තං – මජසං
5. ඛමාමිති – සයා
6. ඛමන්තෙ – මජසං
7. ගතානං – මජසං
8. කච්ච – මජසං



http://www.dhammikaweb.com/

264. මේ කය හැර පියා පිරිනිවෙන්නට රිසියෙමි, වීර වූ දුක් කෙළවර කරන නායකයන් වහන්ස, (ඒ සඳහා) මට අනුදන වදාළ මැනවි.

265. සක් – අකුසු – ද ලකුණින් ගැවැසුණු පියුම් බඳු සියුමැලි පා දිගු කරනු මැනැවි. පුත්‍රප්‍රේමයෙන් ඔබට ප්‍රණාම කරමි.

266. රන්කඳක් බඳු (ඔබ) සිරුර පාළ කරනු මැනැවි. නායකයන් වහන්ස, ඔබගේ කය මැනැවින් දැකීමකොට ශාන්තියට යන්නෙමි'' යි.

267. ජිනේන්ද්‍රයන් වහන්සේ ද්වත්‍රිංශද්වර ලක්‍ෂණෝපෙත සුප්‍රභා-යෙන් අලංකෘත සන්ධ්‍යාවලායෙන් ඉවත් වූ බාලාර්ක (ළහිරු) බඳු (සව)ශරීරය සුළුඹුවට දර්ශනය කර වූ සේක.

268. ඉක්බිති ඕ තොමෝ ප්‍රබුද්ධපද්මසදෘශ වූ තරුණ සූර්‍ය්‍යා බඳු ප්‍රභාවත් චක්‍ර ලක්‍ෂණ ඇති ශ්‍රීපාද මතුයෙහි සිරසින් වැඳ වැටුනා යැ.

269. සූර්‍ය්‍යවංශයට ධවජයක් වූ නරාදිත්‍යයන් (නරශ්‍රේෂ්ඨයන්) හට මේ පැසුළු මරණයෙහිදී ප්‍රණාම කරමි. මම යළි තොප නො දක්මි.

270. ලෝකාග්‍රයන් වහන්ස, ස්ත්‍රීහු නම් සියලු වරද කෙරෙත් යි දන්නා ලදහ. ඉදින් මාගේ කිසියම් දෙසෙක් ඇත්නම් කරුණාවට ආකරවූ උතුමාණනි, එය ක්‍ෂමා කරනු මැනැවි.

271. යම් හෙයෙකින් මම ස්ත්‍රීනට ද පැවිද්ද පුනපුනා යාඥ කළමු ද. ඉදින් එහිලා මාගේ දෙසෙක් ඇත්නම් නරොත්තමයාණනි, එය ක්‍ෂමා කරනු මැනැවි.

272. වීරයන්වහන්ස. ඔබගේ අනුඥයෙන් භික්‍ෂුණීහු මා විසින් අනුශාසිතයහ. ඉදින් එහිලා වරදවා කළ අනුශාසනයෙක් වේ නම් ක්‍ෂමාධිපයාණනි, එද කමත්න.

273. ගුණාභරණ ඇති තැනැත්තිය, ක්ෂමාවට කරුණු නැති තන්හි ක්‍ෂමා කළයුතු කුමක් නම් වන්නේ ද, පිරිනිවන සඳහා යන තොපට මතුයෙහි කුමක් කියම් ද.

274. පවිත්‍ර වූ අනූන වූ මාගේ භික්‍ෂු සඞ්ඝයා මෙ ලොවින් නිස්සරණයට යන කල්හි, පහන්වන කල්හි ග්‍රහතාරකාවන්ගේ ව්‍යසනය දක චන්ද්‍රලෙඛාව නික්මැ යන්නා මෙනි.

275. මෙරු පර්වතය වටා යන චන්ද්‍රානුගත තාරකා සෙයින් ඒ සෙසු භික්‍ෂුණීහු ජිනෙන්ද්‍රයන් වහන්සේ ප්‍රදක්ෂිණා කොට පාමුල වැඳ වැටී (බුදුරදුන්) මුවග බලමින් සිටියාහ.



Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

276. ''න තිත්තපුබ්බං[1] තව දස්සනෙන
චක්ඛුං න සොතං තව භාසිතෙන,
චිත්තං මමං කෙවලමෙකමෙව
පප්පුය්‍ය තං ධම්මරසෙන තිත්තිං,

277. නදතො පරිසායං තෙ වාදිදප්පාපහාරිනො,[2]
යෙ තෙ දක්ඛන්ති වදනං ධඤ්ඤා තෙ නරපුඞ්ගව.

278. දීඝඞ්ගුලී තම්බනඛෙ සුභෙ ආයතපණ්හිකෙ
යෙ පාදෙ පණමිස්සන්ති[3] තෙපි ධඤ්ඤා ගුණන්ධර.

279. මධුරානි පහට්ඨානි දොසග්ඝානි හිතානි ච,
යෙ තෙ වාක්‍යානි සොස්සන්ති[4] තෙපි ධඤ්ඤා නරුත්තම.

280. ධඤ්ඤා'හං තෙ මහාවීර පාදපූජනතප්පරා,
තිණ්ණසංසාරකන්තාරා සුවාක්‍යෙන සිරීමතො.''[5]

281. තතො සා අනුසාසෙත්වා භික්ඛුසඞ්ඝම්පි සුබ්බතා,
රාහුලානන්දනන්දෙ ච වන්දිත්වා ඉදමබ්‍රවි:

282. ''ආසීවිසාලයසමෙ රොගාවාසෙ කළෙබරෙ,
නිබ්බින්නා දුක්ඛසංඝාතෙ[6] ජරාමරණගොචරෙ

283. නානාකලිමලාකිණ්ණෙ[7] පරායත්තෙ නිරීහකෙ,
තෙන නිබ්බාතුමිච්ඡාමි අනුමඤ්ඤථ පුත්තකා.''

284. නන්දො රාහුලභද්දො ච වීතසොකා නිරාසවා,
ඨිතාචලට්ඨිතිථිරා[8] ධම්මතං අනුචින්තයුං.

285. ධිරත්ථු සඞ්ඛතං ලොලං අසාරං කදලූපමං,
මායාමරීචිසදිසං ඉත්තරං අනවට්ඨිතං.

286. යත්ථ නාම ජිනස්සා'යං මාතුච්ඡා බුද්ධපොසිකා,
ගොතමී නිධනං යාති අනිච්චං සබ්බසඞ්ඛතං.'

1. තිත්තිපුබ්බං – මජසං.
2. වාදිතබ්බපහාරිනො – මජසං
3. පණමායන්ති – සයා
4. සුයන්ති – මජසං
5. සද්ධම්මෙන සිරීමතො – PTS
6. දුක්ඛසඞ්ඝාටෙ – මජසං, දුක්ඛසඞ්ඛතෙ – සයා
7. කලලමාකිණ්ණෙ - PTS, කුණපමලාකිණ්ණෙ – සයා
8. ඨිතාචලා ඨිති ථිරා – සයා, PTS

Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

276. (වැළි ද ගෝතමිය මෙසේ පවසයි :) "ඔබගේ දර්ශනයෙන් (අපගේ) ඇස තෘප්ත නොවූ විරූ යැ. ඔබගේ භාෂිතයෙන් කන තෘප්ත නොවූ විරූ යැ. හුදෙක් මාගේ ඒ එකම සිත ධම් රසයෙන් තෘප්තියට පැමිණ සිටියි.

277. නරශ්‍රෙෂ්ඨයාණනි. අභීතනාද පවත්වන (පර) වාදීමාන-මර්දනය කරන ඔබගේ ශ්‍රී මුඛය යම් ඒ කෙනෙක් දකිත් ද, උහු තුමූ භාග්‍යවත් හ.

278. (ලෞකික – ලොකොත්තර) ගුණ ධරණ උතුමාණනි, දිගු ඇඟිලි ඇති, තඹවන් නිය ඇති, දිගු විළුම් ඇති ශුභ වූ (ඔබ) පා යම් කෙනෙක් ප්‍රණාම කෙරෙත් ද, උහු ද ධන්‍ය (පින්වත්) හ.

279. නරොත්තමයාණනි, මිහිරි ප්‍රීතිය ඇති කරන ද්වෙෂය නසන (මෛත්‍රීසහගත වූ)හිත වූ ඔබගේ වචන යම් කෙනෙක් ශ්‍රවණ කෙරෙත් ද, ඔහු ද ධන්‍යයෝ යි.

280. මහාවීරයන් වහන්ස, ඔබ පා පිදීමෙහි නිරත වූ තරණය කළ සසරකතර ඇති මම ශ්‍රීමතාණන්ගේ සුහද වාක්‍යයෙන් භාග්‍ය-සම්පන්න වෙමි."

281. ඉක්බිති මනාවුත ඇති භික්ෂුසඞ්ඝයාට ද අනුශාසනා කොට රාහුල – නන්ද – ආනන්ද යන තෙරණුවන් වැඳ මෙවදන් පැවසූ :

282–283. "සර්පාවාසයක් බඳු රොගයනට වාසස්ථාන වූ දුක් කඳක් වූ නොහොත් දුකින් පෙළුණු ජරා – මරණ දෙකට ගොදුරු වූ නොයෙක් කුණු කසලින් ආකීර්ණ වූ ආත්මායත්ත (තමාසතු) නො වූ අනුත්සුක වූ ශරීරයෙහි කලකිරුණෙම් වෙමි. එහෙයින් පිරිනිවෙන්නට රිසියෙමි. දරුවනි, (එය) අනු දනි වූ".

284. පහ වූ ශෝක ඇති ආස්‍රව රහිත නන්ද තෙරණුවෝ ද රාහුල භද්‍රයෝ ද පව්වක් (නොසැලී) සිටුනා සෙයින් තිර වැ සිටියාහු දහම් සැහැවි අනු වැ සිතූ හු.

285. "ප්‍රත්‍යයෙන් සකැසුණු සැලෙන අසාර (එහෙයින්ම) රඹකඳක් වැනි මායාවක් මිරිඟුවක් බඳු බොහෝ කල් නො පවත්නා තිර වැ නො සිටි මේ කයට නින්ද වේවා.

286. මෝ තොමෝ වූකලී ජිනෙන්ද්‍රයන් වහන්සේගේ සුළු මව යැ, බුදුරදුන් පෝෂණය කළ ගෝතමී පිරිනිවීමට යෙයි. සියලු සකර දහම් අනිස යැ."



http://www.dhammikaweb.com/

287. ආනන්දො ච තදා සෙඛො සොකට්ටො ජිනවච්ඡලො,
තත්ථස්සූනි ධාරෙන්තො සො කරුණං පරිදෙවති.

288. "හා සන්තිං[1] ගොතමී යාති නූන බුද්ධොපි නිබ්බුතිං,
ගච්ඡති න චිරෙනෙව අග්ගිරිව නිරින්ධනො."

289. එවං විලපමානං තං ආනන්දං ආහ ගොතමී:
"සුතිසාගර ගම්භීර බුද්ධුපට්ඨානතප්පර.

290. න යුත්තං සොචිතුං පුත්ත හාසකාලෙ උපට්ඨිතෙ,
තව[2] මෙ සරණං පුත්ත නිබ්බානං සමුපාගතං.[3]

291. තයා තාත සමජ්ඣිට්ඨො පබ්බජ්ජං අනුජානි නො,
මා පුත්ත විමනො හොහි සඵලො තෙ පරිස්සමො.

292. යං න දිට්ඨං පුරාණෙහි තිත්ථිකාචරියෙහි පි,
තං පදං සුකුමාරීහි සත්තවස්සාහි වෙදිතං.

293. බුද්ධසාසනපාලෙතා පච්ඡිමං දස්සනං තව,
තත්ථ ගච්ඡාමහං පුත්ත ගතො යත්ථ න දිස්සතෙ."

294. කදචි ධම්මං දෙසෙන්තො ඛිපි ලොකග්ගනායකො,
තදහං ආසිංසවචං[4] අවොචං අනුකම්පිකා:

295. "චිරං ජීව මහාවීර කප්පං තිට්ඨ මහාමුනෙ,
සබ්බලොකස්ස අත්ථාය භවස්සු අජරාමරො."

296. තං තථාවාදිනිං බුද්ධො මමං සො එතදබ්‍රවි:
"න හෙවං වන්දියා බුද්ධා යථා වන්දසි ගොතමි."

297. "කථං චරහි සබ්බඤ්ඤූ වන්දිතබ්බා තථාගතා,
කථං අවන්දියා බුද්ධා තං මෙ අක්ඛාහි පුච්ඡිතො."

298. "ආරද්ධවිරියෙ පහිතත්තෙ නිච්චං දළ්හපරක්කමෙ,
සමග්ගෙ සාවකෙ පස්ස[5] එසා බුද්ධානවන්දනා."[6] *

1. හාසන්තිං – සයා
2. තයා – මජසං, PTS
3. නිබ්බානං තං සමුපාගතං – සීමු
4. ආසිංසවාචං – මජසං
5. පස්ස – මජසං, සයා., PTS
6. එතං බුද්ධානවන්දනං – මජසං.



http://www.dhammikaweb.com/

287-288. එකල්හි ආනන්ද තෙරණුවෝ සෙඛ (සෝවාන්) හ, බුදුරදුන් කෙරෙහි ස්නෙහ ඇති සොවින් පෙළුණු ඔබ "අහෝ! ගොතමී ශාන්තියට යෙයි, නොබෝ දිනකින් බුදුරජාණෝ ද ඉන්ධන (දර) රහිත ගිනි සෙයින් නිවීමට යන්නාහ" යි සානුකම්පික වැ කඳුළු දරමින් වැලපෙති.

289-290. මෙසේ වැලපෙන ඒ ආනන්ද තෙරණුවනට ගොතමී මෙසේ කිවූ: "ශ්‍රැතියට සාගර (බහුශ්‍රැත) වූ, ගැඹුරු ගුණ ඇති බුද්ධොපස්ථානයෙහි නියැලි පුත්‍රයාණනි, ශෝක කරන්නට අයුතු යැ, හාස (සිනහවට) කාලය එළඹැ සිටියේ යැ, පුත, නිවන වෙත එළැඹැ සිටුනා මට තොපගේ පිහිටයි.

291. දරුව, තොප විසින් සමාරාධිත බුදුහු අපට පැවිද්ද අනු දත්හ. පුත, දොම්නස් නො ව, තොපගේ උත්සාහය සඵල යි.

292. පැරැණි තීර්ථක ඇදුරන් විසින් යම් ශාන්ත ප්‍රතිෂ්ඨාවක් නො දක්නා ලද ද, ඒ ප්‍රතිෂ්ඨාව සිවුමැලි සත්හැවිරිදි දූරියන් විසිනුදු දක්නා ලද යැ.

293. බුදුසසුන පාලනය කරන පුතණුවනි, මේ තොපගේ පශ්චිම දර්ශනයයි. යම් තෙනෙකැ ගියේ නො දක්නා ලැබේ ද, මම එහි යන්නෙමි.

294. ලෝකාග්‍රනායකයන් වහන්සේ කිසිවිටෙකැ දහම් දෙසමින් කිවිසියේක් ද, එවිට අනුකම්පා ඇති මම ආශීර්වාද වචනයක් කීමි:

295. "මහාවීරයන් වහන්ස, බොහෝ කල් ජීවත්වන සේක්වා. මහාමුනීන්ද්‍රයන් වහන්ස, කපක් වැඩසිටුනා සේක්වා. මුළුලොවට වැඩ පිණිස අජරාමර වන සේක්වා" යි.

296. එසේ කියන ඒ මට බුදුහු තෙල වදළහ: "ගොතමිය, (තෙපි) යම් අයුරකින් වඳනාහු ද, ඒ අයුරින් තථාගතයෝ නො වැන්ද යුත්තාහු" යි.

297. "සර්වඥයන් වහන්ස, තථාගතයෝ කිසෙයින් වැන්ද යුතු ද, බුදුහු කිසෙයින් නො වැන්ද යුතු දැයි පුළුවුත් ඔබ එ කරුණ මට කියනසේක් වා."

298. (බුදුහු) "රුකුළු වැර ඇති නිවනට මෙහෙයූ සිත් ඇති සතතයෙන් දැඩි පැරකුම් ඇති සමග වැ සිටුනා සව්වන් දක්නේ නම් තෙලෙ බුදුනට වඳනා වෙයි." වදළහ.



http://www.dhammikaweb.com/

299. තතො උපස්සයං ගන්ත්වා එකිකාහං විචින්තයිං,
සමග්ගං පරිසං නාථො රොචෙති[1] තිභවන්තගො.

300. හන්දහං පරිනිබ්බිස්සං මා විපත්තිං තමද්දසං."[2]
එවාහං චින්තයිත්වාන දිස්වාන ඉසිසත්තමං.

301. පරිනිබ්බානකාලං මෙ[3] ආරොචෙසිං විනායකං,
තතො සො සමනුඤ්ඤාසි "කාලං ජානාහි ගොතමී."

302. කිලෙසා ඣාපිතා මය්හං හවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවා.

303. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

304. පටිසම්භිද චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

305. ථීනං ධම්මාභිසමයෙ යෙ බාලා විමතිං ගතා,
තෙසං දිට්ඨිපහානත්ථං ඉද්ධිං දස්සෙහි ගොතමී.

306. තදා නිපච්ච සම්බුද්ධං උප්පතිත්වාන අම්බරං,
ඉද්ධී අනෙකා දස්සෙසි බුද්ධානුඤ්ඤාය ගොතමී,

307. එකිකා බහුධා ආසි බහුකා චෙකිකා තථා,
ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොනගං.

308. අසජ්ජමානා අගමා භූමියම්පි නිමුජ්ජථ,
අභිජ්ජමානෙ උදකෙ අගඤ්ඡි මහියා යථා.

309. සකුණීව යථාකාසෙ පල්ලඞ්කෙන ගමී තදා,
වසං වත්තෙසි කායෙන යාව බ්‍රහ්මනිවෙසනං.

310. සිනෙරුං දණ්ඩං කත්වාන ඡත්තං කත්වා මහාමහිං
සමූලං පරිවත්තෙත්වා ධාරෙන්තී[4] චඞ්කමී නභෙ.

311. ඡසූරොදයකාලෙව ලොකඤ්චාකාසි ධූමිතං,
යුගන්තෙ විය ලොකං සා ජාලාමාලාකුලං අකා.

---

1. රොචෙසි – මජසං.
2. විපත්තිතමද්දසං – මජසං.
3. මං – සයා
4. ධාරයං – මජසං

Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

299. ඉක්බිති මම මෙහෙණවරට ගොස් එකලා වැ සිතුමි: "ත්‍රිවිධ භවයාගේ අන්තයට ගිය නාථයන්වහන්සේ සමගපිරිස් පිරිවන සේකැ.

300-301. මම පිරිනිවෙන්නෙමි, ඒ විපත නො දකිම්වා" යි මම මෙසේ සිතා විනායක මහර්ෂි බුදුරදුන් දැක, මාගේ පරිනිර්වාණ කාලය ආරොචනා කළෙමි, ඉක්බිති ඔබ "ගොතමිය, කල් දනුව" යි අනුදත්හ.

302. (ගොතමී) "මා විසින් කෙලෙස්හු දවන ලදහ. සියලු භවයෝ මුලිනුපුටා නසන ලදහ. බැඳුම් සිඳ සරණ ඇත්රැජිනක සෙයින් ආශ්‍රව රහිත වැ වාස කරමි.

303. බුද්ධශ්‍රේෂ්ඨයන් වෙතැ මට යහපතෙක් වියැ. ත්‍රිවිද්‍යා අනුප්‍රාප්ත යැ, බුදුසසුන් කරන ලද.

304. මෙ සිවුපිළිසිඹියා ද අෂ්ටවිමොක්ෂ ද ෂඩභිඥා ද පසක් කරන ලද යැ, බුදුසසුන් කරන ලදී.

305. (බුදුහු) "මාගමුන්ගේ ධර්මාභිසමයෙහි යම් අඥානකෙනෙක් විමතියට ගියාහු ද, ඔවුන්ගේ දෘෂ්ටිප්‍රහාණය පිණිස ගෝතමිය, ඍද්ධි දක්වන්න.

306. එකලැ ගොතමී මෙහෙණ සම්බුදුන් ප්‍රණාම කොට අහසට පැන නැගැ බුදුරදුන්ගේ අනුදැන්මෙන් නොයෙක් ඍද්ධි දැක්වූ.

307-308. එකක් වැ බොහෝ ආකාර වූ, එසෙයින් ම බොහෝ වැ එකක් වූ, ප්‍රකට බවට, අප්‍රකට බවට, පවුරෙන් සරසැ පව්වෙන් සරසැ (නොගැටී) ගියා යැ. (දියෙහි මෙන්) පොළොවෙහි ද ගැලුණා යැ. පොළොවෙහි මෙන් දියෙහි නො බිඳිමින් ඇවිද්ද යැ.

309. කිරිල්ලක මෙන් අහසෙහි පර්‍යඞ්කයෙන් යුතු වැ ගියා යැ, බඹලොව තෙක් (මුළු ලොව) කයින් වශයෙහි පැවැත් වූ

310. මහමෙර සැත්දණ්ඩ කොටැ මහ පොළොව සතක් කොටැ සහමුලින් පෙරළා ධරමින් නාගොගර්භයෙහි සක්මන් කළා යැ.

311. සහිරු උදා කල්හි මෙන් ලොව දුම් ඇති කළා යැ. ඕ කල්පාන්තයෙහිදී මෙන් ලොකය අග්නිජාලායෙන් ආකුල කළා යැ.



http://www.dhammikaweb.com/

312. මුචලින්දං මහාසෙලං මෙරු මන්දර දද්දරෙ,[1]
සාසපෙරිව සබ්බානි එකෙනග්ගහි මුට්ඨිනා.

313. අඞ්ගුලෙනෙව ඡාදෙසි භාකරං සනිසාකරං,
චන්දසූරසහස්සානි ආවෙළමිව ධාරයි.

314. චතුසාගරතොයානි ධාරයී එකපාණිනා,
යුගන්තජලදාකාරං මහාවස්සං පවස්සයි[2]

315. චක්කවත්තිං සපරිසං මාපයී සා නභත්තලෙ.
ගරුළං ද්විරදං සීහං විනදන්තං ච දස්සයි.

316. එකිකා අභිනිම්මිත්වාප්පමෙය්‍යං භික්ඛුනීගණං,
පුන අන්තරධාපෙත්වා එකිකා මුනිමබ්‍රවි:

317. "මාතුච්ඡා තෙ මහාවීර තවසාසනකාරිකා
අනුප්පත්තා සකං අත්ථං පාදෙ වන්දති[3] චක්ඛුම."

318. දස්සෙත්වා විවිධා ඉද්ධී ඔරොහිත්වා නභත්තලා,
වන්දිත්වා ලොකපජ්ජොතං එකමන්තං නිසීදි සා.

319. "සා වීසංවස්සසතිකා[4] ජාතියාහං මහාමුනෙ.
අලමෙත්තාවතා වීර නිබ්බායිස්සාමි නායක."

320. තද'තිවිම්හිතා සබ්බා පරිසා සා කතඤ්ජලී,
අවොච'ය්‍යා කථං ආසි අතුලිද්ධිපරක්කමා.

321. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

322. තදහං හංසවතියං ජාතාමච්චකුලෙ අහුං,
සබ්බූපකාරසම්පන්නෙ ඉද්ධෙ ඵීතෙ මහද්ධනෙ.

323. කදාචි පිතුනා සද්ධිං දාසීගණපුරක්ඛතා,
මහතා පරිවාරෙන තං උපෙච්ච නරාසභං.

---

1. මෙරුමූලනදබ්බරෙ - මජසං,
මෙරුං මන්දරදන්තරෙ - සයා
2. පවස්සථ - මජසං,
3. වන්දාමි - මජසං, සයා, PTS.
4. වීසවස්සසතිකා - මජසං



http://www.dhammikaweb.com/

312. මුචලින්ද මහාශෛලය, මේරු - මන්දර - දද්දර පර්වත යන සියල්ල අබඇට සෙයින් එක් මිටකින් ගත්තා යැ.

313. නිසයුරු සහිත හිරු ඇඟිලිතුඩින් වැසූ, දහස්ගණන් සඳ හිරු මුදුන් මල්කඩ සෙයින් ධැරූ,

314. සියුසයුරෙහි දිය එක් අත්ලෙන් ධැරූ, යුගාන්ත මෙඝයක් බඳු මහවැසි වැස්වූ.

315. ඕ අහස්තෙලෙහි සපිරිස් සක්විතිරජකු මැවූ, ගුරුළකු, ඇතකු ගර්ජනාකරන සිංහයකු දක්වූ.

316. එකලා වැ අපමණ මෙහෙණ ගණයා මවා යළි අතුරුධන් කොට එකක් වැ මුනිරජුනට (මෙසේ) කිවූ:

317. "මහාවීරයන් වහන්ස, (මේ) ඔබගේ අනු සසුන් කරන ඔබගේ සුළුමවයි. චක්‍ෂුර්මතාණනි, (ඕ) ස්වාජීයට පැමිණියා (ඔබ) පා වදියි."

318. ඕ නොයෙක් සෘද්ධි දක්වා අහස්තෙලෙන් බැස ලොවට පහනක් වූ බුදුරදුන් වැඳ එකත්පසෙකැ හුන්නා යැ.

319. (ඉක්බිති මහාපජාපති ගොතමී මෙසේ කිවූ :) "මහා මුනිවරයාණනි, ඒ මම උපතින් එක්සියවිසි හැවිරිදි වෙමි. වීරයාණනි, මෙපමණකින් සෑහෙයි, නායකයාණනි, පිරිනිවෙන්නෙමි" යී.

320. එකලැ අතිවිස්මයට පැමිණි ඒ සියලු පිරිස් කෘතාඤ්ජලි වැ (මෙසේ) කී.: "ආයඞාවනි, කෙසේ නම් (මෙබඳු) අසමාන සෘද්ධි පරාක්‍රම ඇති වූයෙහි" ද?

321. සියලු ධර්මයන්හි චක්‍ෂුර්මත් වූ (ලොවට) නායක වූ පදුමුත්තර ජිනෙන්ද්‍රයන් වහන්සේ මෙයින් ලූවහස්වන කප්හි (ලොවැ) පහළ වූ සේකි.

322. එසමයෙහි මම හංසවතී නගරයෙහි සියලු උපකරණයෙන් යුත් සමෘද්ධිමත් සර්වසම්පූර්ණ මහාධන ඇති ඇමැතිකුලයෙකැ උපන්මි.

323. කිසිවිටෙකැ දසි සමූහයා විසින් පෙරටුකරන ලදු වැ මහ පිරිවරින් පියා සමග ඒ නරශ්‍රෙෂ්ඨයන් වෙතැ එළඹැ-



http://www.dhammikaweb.com/

324. වාසවං විය වස්සන්තං[1] ධම්මමෙඝං අනාසවං,
සරදදිච්චසදිසං රංසිමාලාකුලං ජිනං.[2]

325. දිස්වා චිත්තං පසාදෙත්වා සුත්වා චස්ස සුභාසිතං,
මාතුච්ඡං භික්ඛුනිං අග්ගෙ ඨපෙන්තං නරනායකං.

326. සුත්වා දත්වා මහාදානං සත්තාහං තස්ස තාදිනො,
සසඞ්ඝස්ස නරග්ගස්ස පච්චයානි බහූනි ච.

327. නිපච්ච පාදමූලම්හි තං ඨානං අභිපත්ථයිං,
තතො මහාපරිසතිං අවොච ඉසිසත්තමො:

328. "යා සසඞ්ඝං අභොජෙසි සත්තාහං ලොකනායකං,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

329. සතසහස්සෙ ඉතො[3] කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම ගොත්තෙන[4] සත්ථා ලොකෙ භවිස්සති.

330. තස්ස ධම්මෙසු දායාදා ඔරසා ධම්මනිම්මිතා,
ගොතමී නාම නාමෙන හෙස්සති සත්ථුසාවිකා.

331. තස්ස බුද්ධස්ස මාතුච්ඡා ජීවිතාපාදිකා[5] අයං,
රත්තඤ්ඤූනං අග්ගත්තං භික්ඛුනීනං ලභිස්සති."

332. තං සුත්වාන[6] පමුදිතා[7] යාවජීවං තදා ජිනං,
පච්චයෙහි උපට්ඨිත්වා තතො කාලකතා අහං.

333. තාවතිංසෙසු දෙවෙසු සබ්බකාමසමිද්ධිසු.
නිබ්බත්තා දසහඞ්ගෙහි අඤ්ඤෙ අභිභවිං අහං.

334. රූපසද්දෙහි ගන්ධෙහි රසෙහි ඵුසනෙහි ච,
ආයුනාපි ච වණ්ණෙන සුඛෙන යසසාපි ච.

335. තථෙවාධිපතෙය්‍යෙන අධිගය්හ විරොචි'හං,
අහොසිං අමරින්දස්ස මහෙසී දයිතා තහිං.

336. සංසාරෙ සංසරන්තීහං කම්මවායුසමෙරිතා,
කාසිස්ස රඤ්ඤො විසයෙ අජායිං දසගාමකෙ.

337. පඤ්චදසසතා'නූනා නිවසන්ති තහිං තදා,
සබ්බෙසං තත්ථ යො ජෙට්ඨො තස්සා ජායා අහොස'හං.

1. වස්සන්තං – මජසං,
2. රංසිජාලසමුජ්ජලං – මජසං, ස්‍යා. රංසිජාලාකුලං ජිනං – PTS
3. සතසහස්සිතො – මජසං.
4. නාමෙන – සිමු
5. ජීවිතපාලිකා – ස්‍යා.
6. සුත්වා'හං – සිමු, ස්‍යා, PTS
7. පමොදිත්වා – මජසං

Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

324-326. ශක්‍රදේවේන්ද්‍රයා වැනි ධම්මෙඝය වස්වන ආශ්‍රව රහිත සරාහිරු බඳු රැස්මාලා ඇති ජිනේන්ද්‍රයන් දැක සිත පහදවා ඔබගේ සුභාෂිතය ද අසා නරශ්‍රෙෂ්ඨයන් වහන්සේ (සිය) සුළුමව වූ මෙහෙණ අගතන්හි (එතදග්‍රයෙහි) තබනු අසා අකම්ප්‍ය ගුණ ඇති ඔබට සත්දිනක් මහදන්දී සඞ්ඝයා සහිත නරොත්තමයන් වහන්සේට බොහෝ ප්‍රත්‍යය ද ප්‍රදානය කොටැ-

327. (ඔබ) පාමුල්හි වැදහෙවැ එ තනතුර පැතූමු. ඉක්බිති ඍෂිශ්‍රෙෂ්ඨයන් වහන්සේ මහපිරිස් මැද මෙසේ වදළ සේක:

328. "යම් කාන්තාවක් සඞ්ඝයා සහිත ලෝකනාථයන් සත් දිනක් මුළුල්ලෙහි වැළඳ වූ ද, මම ඇය කීර්තනය (ප්‍රකාශ) කරමි. (එසේ) කියන මාගේ බස් අසවු:

329. "මෙයින් සියක්දහස්වන කපහි ඔක්කාක කුලය සම්භව කොට ඇති ගෝත්‍රයෙන් ගෝතම නම්වූ ශාස්තෘ තෙමෙ ලොවැ පහළ වන්නේ යැ.

330. (මෙ කාන්තා තොමෝ) ඔබ දහමට හිමි වූ ඖරස වූ ධර්මයෙන් නිර්මිත වූ නමින් ගොතමී නම්වූ ශාස්තෘශ්‍රාවිකාවක් වන්නී යැ.

331. ඒ තථාගතයන්ගේ දිවි වඩාලන සුළුමවූ වන මෝ රාත්‍රඥ (පැවිදි වැ බොහෝකල් ඇති) මෙහෙණන් අතර අග්‍රබව ලබන්නී යැ."

332. එ අසා ප්‍රමුදිත වූ මම එකලැ දිවිහිම් කොට ජිනේන්ද්‍රයන් වහන්සේ (සිවු) පසයෙන් උපස්ථාන කොට එ අත්බැවින් කළුරිය කෙළෙමි-

333. සියලු කාමයෙන් සමෘද්ධ වූ තවතිසා දෙවියන් අතර උපන්නෙමි සෙසු දෙවියන් දස කරුණකින් අභිභවා සිටියමු.

334. රූපයෙන් ශබ්දයෙන් ගන්ධයෙන් රසයෙන් හා ස්ප්‍රෂ්ටව්‍ය-යෙන් ද, ආයුෂයෙන් ද වර්ණයෙන් සුඛයෙන් හා වැළි යශසින් ද-

335. එසෙයින් ම අධිපතිභාවයෙන් ද (සෙසු දෙවියන්) අභිභවා බැබළුණෙම් මම එහි දෙව්රජුගේ ප්‍රේමණීය මෙහෙසි වූමු.

336. සසර සැරිසරන මම කම්වායුයෙන් මෙහෙයන ලදුයෙම් කාසි රජුගේ විජිතයෙහි දසග්‍රාමයෙකැ උපන්මු.

337. එකලැ එගමෙහි නො අඩු වැ පන්සියයක් දස්හු වෙසෙති. එහි සියල්ලනට යමෙක් දෙටු ද, මම ඔහුගේ භාර්‍යා වූමු.



http://www.dhammikaweb.com/

338. සයම්භුනො පඤ්චසතා ගාමං පිණ්ඩාය පාවිසුං,
තෙ දිස්වාන අහං තුට්ඨා සහ සබ්බාහි ඤාතිහි.[1]

339. කත්වා පඤ්චසතකුටී[2] චතුමාසෙ උපට්ඨිය,[3]
තිචීවරානි දත්වාන පසන්නාම්හ[4] සසාමිකා.

340 තතො චුතා සපතිකා[5] තාවතිංසගතා මයං,
පච්ඡිමෙ ච භවෙ'දානි ජාතා දෙවදහෙ පුරෙ.

341. පිතා අඤ්ජනසක්කො මෙ මාතා මම සුලක්ඛණා,
තතො කපිලවත්ථුස්මිං සුද්ධොදනඝරං ගතා.

342. සෙසා[6] සක්‍යකුලෙ ජාතා සක්‍යානං ඝරමාගමුං,
අහං විසිට්ඨා සබ්බාසං ජිනස්සා'පාදිකා අහුං.

343. මම පුත්තො'භිනික්ඛම්ම[7] බුද්ධො ආසි විනායකො,
පච්ඡාහං පබ්බජිත්වාන සතෙහි සහ පඤ්චහි.

344. සාකියානීහි ධීරාහි සහ සන්තිසුඛං ඵුසිං,
යෙ තදා පුබ්බජාතියං අම්හාකං අහු සාමිනො.

345. සහ පුඤ්ඤස්ස කත්තාරො මහාසමයකාරකා,
ඵුසිංසු අරහත්තං තෙ සුගතෙනානුකම්පිතා.

346. තදෙතරා භික්ඛුනියො ආරුහිංසු නභත්තලං,
සඞ්ගතා[8] විය තාරායො විරොචිංසු මහිද්ධිකා.

347. ඉද්ධී අනෙකා දස්සෙසුං පිළන්ධවිකතිං[9] යථා,
කම්මාරො කනකස්සෙව කම්මඤ්ඤස්ස සුසික්ඛිතො.[10]

348. දස්සෙත්වා පාටිහීරානි විචිත්තානි[11] බහූනි ච,
තොසෙත්වා වාදිපවරං මුනිං සපරිසං තදා.

349. ඔරොහිත්වාන ගගනා වන්දිත්වා ඉසිසත්තමං,
අනුඤ්ඤාතා නරග්ගෙන යථාඨානෙ නිසීදිසුං.

350. ''අහො'නුකම්පිකා අම්හං සබ්බාසං වීර ගොතමී,
වාසිතා තව පුඤ්ඤෙහි පත්තා නො ආසවක්ඛයං.

---

1. සබ්බාහි ඤාතිහි - මජසං
2. පූගා හුත්වාව සබ්බායො - මජසං
3. උපට්ඨහුං - මජසං
4. සංසරිම්හ - සිමු, මජසං
5. සබ්බාපි තා - මජසං
6. සබ්බා - සයා
7. ස මෙ පුත්තො... - සයා
8. ඔගතා - සිමු
9. පිළන්ධවිකතිං - මජසං
10. පුඤ්ඤකම්මෙසු සික්ඛිතා - සයා
11. විවිධානි - සයා



http://www.dhammikaweb.com/

338-339. පන්සියයක් පසේබුදුහු පිඬු පිණිස ගමට පිවිසුණාහ. ඔබ දැක තුටුපත් වැ සියලු නෑයන් සමග පන්සියයක් කුටි තනා සිවුමසක් මුළුල්ලෙහි උවටැන් කොට තුන්සිවුරු දී සැමියන් සහිත වැ ප්‍රසන්න වූම්හ.

340. සැමියන් සහිත අපි එයින් සැවැ තව්තිසාවට ගියම්හ, දුන් පැසුළු බෙවෙහි දූ දෙව්දහ නුවර (එක්වැ) උපනුම්හ.

341. මාගේ පිය තෙමේ අඤ්ජන ශාක්‍යරජ යැ, මාගේ මව සුලක්ඛණාදේවී ය. ඒ දෙව්දහ නුවරින් කිඹුල්වත් පුර සුදෙවුන් රජුගේ ගෙට (සරණ) ගියා වෙමි.

342. ශාක්‍ය කුලයෙහි උපන් සෙසු දස්සෝ ශාක්‍යරජුන්ගේ ගෙට ගියහ. (ශාක්‍යරජුන් හා විවාහ වූහ.) සියල්ලන් අතුරෙහි විශිෂ්ට වූ මම ජිනේන්ද්‍රයන්ගේ පොෂක (-කිරි) මව වූමු.

343-344. මාගේ පුත් අභිනිෂ්ක්‍රමණය කොට (තමහට නායක යකු නැති හෙයින්) විනායක බුද්ධ වියැ. පසු කලැ මම පන්-සියයක් ශාක්‍ය කුමරියන් සමග පැවිදි වැ ධීර වූ ඔවුන් හා ශාන්තිසුඛය (-නිවන් සුව) ස්පර්ශ කළමු. ඒ පෙරදැහි යම් කෙනෙක් අපගේ ස්වාමිපුරුෂ වූහු ද-

345. එක් වැ පින් කළ (දුන්) මහාසමයකාරක ඔහු සුගතයන් වහන්සේ විසින් අනුකම්පිත වූවාහු අර්හත්වය ස්පර්ශ කළාහ.

346. ඒ සෙසු මෙහෙණහු අහස්තලයට නැගුණාහ. මහත් සෘද්ධි ඇත්තාහු එක්රැස්වූ තාරකා සෙයින් බැබළුණාහු යැ.

347-348. (ඔහු) නොයෙක් සෘද්ධි දක්වූහු. රන්කම්හි මොනොවට හික්මුණු කම්මාරපුත්‍රයකු (-රන්කරුවකු) කම්මෙණා ස්වර්ණය කින් බොහෝ ආභරණ විශෙෂ (කනා ප්‍රදර්ශනය කරන්නාක්) සෙයින් (ඒ මෙහෙණහු) බොහෝ විසිතුරු පෙළහර දක්වා එදිනැ පිරිස් සහිත වාදීවර මුනීන්ද්‍රයන් වහන්සේ සතුටු කොට-

349. අහසින් බැස උත්තම සෘෂි වූ මුනිරජුන් නැමැ ද නරාග්‍ර තථාගතයන් වහන්සේ විසින් අනුදන්නා ලද්දහු සුදුසු තන්හි හුන්හ.

350. වීරයන් වහන්ස, ආශ්චර්යයෙක, ගොතමී තොමෝ අප සියල්ලන්ට අනුකම්පා ඇත්තී යැ, නුඹ වහන්සේගේ කුශලයන් විසින් වාසිත වූ අපි ආස්‍රවක්ෂය සංඛ්‍යාත නිවනට පැමිණියම්හ.



http://www.dhammikaweb.com/

351. කිලෙසා ඣාපිතා අම්හං භවා සබ්බෙ සමූහතා
නාගීව බන්ධනං ඡෙත්වා විහරාම අනාසවා.

352. ස්වාගතං වත නො ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

353. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

354. ඉද්ධීසු ච වසී හොම දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී හොම මහාමුනෙ.

355. පුබ්බෙනිවාසං ජානාම දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

356. අත්ථෙ ච ධම්මෙ නෙරුත්තෙ පටිභානෙ ච විජ්ජති
ඤාණං අම්හං මහාවීර උප්පන්නං තව සන්තිකෙ.

357. අස්මාභි පරිචිණ්ණො'සි මෙත්තචිත්තාහි නායක
අනුජානාහි සබ්බාසං[1] නිබ්බානාය මහාමුනෙ.''

358. ''නිබ්බායිස්සාම ඉච්චෙවං කිං වක්ඛාමි වදන්තියො[2]
යස්සදානි ච වො කාලං මඤ්ඤථා''ති ජිනො'බ්‍රවි.

359. ගොතමී ආදිකා තායො තදා භික්ඛුනියො ජිනං
වන්දිත්වා ආසනා තම්හා වුට්ඨාය අගමංසු තා.

360. මහතා ජනකායෙන සහ ලොකග්ගනායකො
අනුසංයායි සො[3] වීරො මාතුච්ඡං යාව කොට්ඨකං.

361. තදා නිපති පාදෙසු ගොතමී ලොකබන්ධුනො
සහෙතරාහි[4] සබ්බාහි පච්ඡිමං පාදවන්දනං.

362. ''ඉදං පච්ඡිමකං මය්හං ලොකනාථස්ස දස්සනං
න පුනො අමතාකරං පස්සිස්සාමි මුඛං තව.

363. න ච මෙ වන්දනං වීර තව පාදෙ සුකොමලෙ
සම්ඵුසිස්සාමි ලොකග්ග අජ්ජ ගච්ඡාමි නිබ්බුතිං.

1. සබ්බායො – ස්‍යා, PTS
2. වදන්තිනං – සීමු
3. අනුසංසාවයි – ස්‍යා.
4. සහෙවතාහි – මජ්සං



http://www.dhammikaweb.com/

351. අප විසින් කෙලෙස්හු දවන ලදහ. සියලු භවයෝ මුල් සිඳ නසන ලදහ. බැඳුම් සිඳ සරණ හස්තිරාජිනීන් සෙයින් ආස්‍රව රහිත වැ වාස කරමු.

352. බුදුරජාණන් වහන්සේ වෙතැ (එළැඹීමෙන්) අපට ස්වාගත යෙක් වියැ. ත්‍රිවිද්‍යා අනුප්‍රාප්ත යැ. බුදුසසුන් කරන ලදී.

353. මෙ සිවුපිළිසිඹියා ද අෂ්ටවිමොක්‍ෂ ද ෂට් අභිඥ ද ප්‍රත්‍යක්‍ෂ කරන ලද යැ. බුදුසසුන් කරන ලදී.

354. මහාමුනිතුමනි, ඍද්ධීන්හි වශී වෙමු, දිබ්බසොතධාතුයෙහි (–දිව්කන්හි) ද චෙතොපරියඤාණයෙහි (–පරසිත් දන්නා නුවණෙහි) ද වශී වෙමු.

355. පෙර විසූ කඳපිළිවෙළ දනිමු. දිවැස පිරිසුදු කරන ලද යැ සියලු ආස්‍රව ගෙවී ගියේ යැ දුන් යළි ඉපැත්මෙක් නැති.

356. මහාවීරයන් වහන්ස, අපට අර්ථයෙහිත් ධර්මයෙහිත් නිරුක්තියෙහිත් ප්‍රතිභානයෙහිත් යම් ඥනයක් වේ ද, (එ ඥනය) තොප හමියෙහි දී උපනැ.

357. නායකයන් වහන්ස, අප විසින් මෙත් සිතැති වැ පුරුදු (–ඇසුරු) කරන ලදහු, (අප) සියල්ලනට පිරිනිවන් පිණිස අනුදන වදළ මැනැවි.

358. "පිරිනිවෙන්නමු යි මෙසේ පවසන්නන්හට කුමක් කියම් ද, යමක් පිණිස (කාලය අපෙක්ෂා කරන්නහු නම්) තෙපි (ඒ කාලය) දනිවු" යි ජිනෙන්ද්‍රයන් වහන්සේ වදළ සේකැ.

359. එවිට ගොතමී ආදි ඒ භික්‍ෂුණීහු ජිනෙන්ද්‍රයන් වැඳ එ හුනස්නෙන් නැගැ ගියාහ.

360. ඒ වීර වූ ලෝකාග්‍රනායකයන් වහන්සේ මහාජන සමූහයා සමග දෙරකොටුව තෙක් සුළුමව අනුව වැඩම කළ සේකැ.

361. එකලැ ගොතමී තෙරණියෝ සෙසු සියල්ලන් සමග පැසුළු පා වැඳුම කෙරෙමින් ලෝකබන්ධු බුදුරදුන් පා මුල වැද වැටුණාහ.

362. (ඕ මෙසේ පවසයි :) "ලොකනාථයන් පිළිබඳ මෙ මාගේ පැසුළු දකුම යි, අමෘතයට ආකර වූ තොපගේ මුඛය යළි නො දක්මු.

363. වීරයන් වහන්ස, මුඹ වහන්සේගේ සියුමැළි පා සඟළ නැවත වැඳීමෙක් මට නො ද ඇති, ලෝකාග්‍රයන් වහන්ස, (ඔබ පා) ස්පර්ශ කරමි. අද පිරිනිවනට යමි.

364. රූපෙන කිං තවා'නෙන දිට්ඨෙ ධම්මෙ යථාතථෙ
සබ්බං සඞ්ඛතමෙවෙතං අනස්සාසිකමිත්තරං.''

365. සා තාහි සහ[1] ගන්ත්වාන භික්ඛුනූපස්සයං සකං
අඩ්ඪපල්ලඞ්කමාභුජ්ජ නිසීදි පරමාසනෙ.

366. තද උපාසිකා තත්ථ බුද්ධසාසනවච්ඡලා
තස්සා පවත්තිං සුත්වාන උපෙසුං පාදවන්දිකා.

367. කරෙහි උරං පහන්ත්වා ඡින්නමූලා යථා ලතා
රොදන්තා කරුණං රාවං[2] සොකට්ටා භූමිපාතිකා[3]

368. "මා නො සරණදෙ නාථෙ විහාය ගමි නිබ්බුතිං
නිපතිත්වාන යාචාම සබ්බායො සිරසා මයං.''

369. යා පධානතමා තාසං සද්ධා පඤ්ඤා උපාසිකා
තස්සා සීසං පමජ්ජන්තී ඉදං වචනමබ්‍රවි:

370. "අලං පුත්තා විසාදෙන මාරපාසානුවත්තිනා
අනිච්චං සඞ්ඛතං සබ්බං වියොගන්තං චලාචලං.''

371. තතො සා තා විසජ්ජිත්වා පඨමං ඣානමුත්තමං
දුතියං තතියං චාපි සමාපජ්ජි චතුත්ථකං.

372. ආකාසායතනඤ්චෙව විඤ්ඤාණායතනං තථා
ආකිඤ්චඤ්ඤං නෙවසඤ්ඤං සමාපජ්ජි යථාක්කමං.

373. පටිලොමෙන ඣානානි සමාපජ්ජිත්ථ ගොතමී
යාවතා පඨමං ඣානං තතො යාව චතුත්ථකං.

374. තතො වුට්ඨාය නිබ්බායි දීපච්චීව නිරාසනා[4]
භූමිචාලො මහා ආසි නභසා විජ්ජුතා පති.

375. පනාදිතා දුන්දුභියො පරිදෙවිංසු දෙවතා
පුප්ඵවුට්ඨී ච ගගනා අභිවස්සථ මෙදිනිං.

376. කම්පිතො මෙරුරාජාපි රඞ්ගමජ්ඣෙ යථා නටො
සොකෙනෙවාතිදීනො ච[5] විරවො ආසි සාගරො.

---

1. සා සහ තාහි - මජසං.
2. රවං – මජසං.
3. භූමිපාතිතා – මජසං.
භුවි පාතිතා – PTS
4. නිරාසවා – මජසං.
5. සොකෙන චාතිදීනොව - මජසං.

Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

364. තොපගේ යථාස්වභාව (සත්‍ය) ධර්මය දුටු කල්හි මේ රූපයෙන් කවර වැඩෙක් ද, මෙල සියල්ල සඞ්ඛත (හේතුයෙන් හටගත්තේ) යැ, ආස්වාද (අස්වැසිලි) රහිත යැ, බොහෝ කල් නො පවත්නේ'' යි.

365. ඕ ඔවුන් සමග සිය මෙහෙණවරට ගොස් අඩ පළඟ බැඳ උතුම් අස්නෙහි හුන්නා යැ.

366. එකලැ එහි බුද්ධශාසනමාමක වූ උවැසියෝ ඇය (ගොතමී) ගේ පුවත් අසා පා වඳිනු රිසියෝ වැ එළැඹුණාහ.

367. (ඔහු) ළෙහි අතින් පැහැර බැගෑ හඬින් හඬමින් සොවින් පෙළුණෝ වැ මුල්සුන් ලියවැල් සෙයින් බිම වැටීම ඇති වූවාහු —

368. ''අපහට ශරණදයක වූ, නාථ වූ උත්තමාවනි, අපි සියල්ලෝ සිරසින් වැඳ වැටී (තොප) අයැදුම්හ: අප හැරපියා නිවනට නහමක් යනු මැනැවි'' යි කීහු.

369. ඔවුනතර ප්‍රධානතම වූ සැදැහැවත් නුවණ ඇති යම් උවැසියක් වූද, (ගොතමී) ඇය හිස පිරිමදිමින් මෙ වදන් පැවැසූ:

370. ''දරුවනි, මාරබන්ධන අනුව වටනා සොවින් කම් නැත, සඞ්ඛත ධර්ම සියල්ල අනිස යැ, වෙන්වීම කෙළවර කොට ඇත, නිරතුරු වෙනස්වනසුලු'' යි (කියා යි.)

371–372. ඉක්බිති ඕ ඔවුන් බැහැර යවා උතුම් වූ ප්‍රථමධ්‍යාන යට සමවැදුණු. දෙවැනි, තෙවැනි, සිවුවැනි ධ්‍යානයනට ද එසෙයින් ම පිළිවෙළින් ආකාසානඤ්චායතන යැ විඤ්ඤාණඤ්චායතන යැ ආකිඤ්චඤ්ඤායතන යැ නේවසඤ්ඤා නාසඤ්ඤායතන යැ යන සමවතට ද සමවැදුණා යැ.

373. ගොතමී තෙරණියෝ පළමුවැනි ධ්‍යානය තෙක් පිළිලොම් විසින් ධ්‍යානයනට සමවැදුණාහ. එයින් (අනුලොම් විසින්) සිවුවැනි ධ්‍යානය තෙක් සමවන්හ.

374. එයින් නැගී සිට තෙල් නැති පහන් සිළක් සෙයින් පිරිනිවියාහ. (එකෙණෙහි) මහාභූමිචලනයෙක් වියැ. අහසින් විදුලිධාරා ද පතිත වී.

375. මහාමේඝයෝ ගර්ජනා කළහ. දෙවියෝ වැළපුණාහ. අහසින් පොළොවට මල්වැසි ද වට.

376. රඟමඬලෙහි නළුවකු මෙන් මේරුපර්වතය ද කම්පිත වියැ, සොවින් දීන වූ සෙයින් මහසයුර ද විරාව (මහත් ඝොෂ) ඇති වී.



Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

377. දෙවා නාගාසුරා බ්‍රහ්මා සංවිග්ගා'හංසු[1] තඞ්ඛණෙ:
"අනිච්චා වත සඞ්ඛාරා යථායං විලයං ගතා,

378. යා චෙ'මං පරිවාරිංසු සත්ථුසාසනකාරිකා
තායො'පි අනුපාදනා දීපච්චී[2] විය නිබ්බුතා."

379. "හා යොගා විප්පයොගන්තා හා'නිච්චං සබ්බසඞ්ඛතං
හා ජීවිතං විනාසන්තං" ඉච්චාසි පරිදෙවනා.

380. තතො දෙවා ච බ්‍රහ්මා ච ලොකධම්මානුවත්තනං
කාලානුරූපං කුබ්බන්ති උපෙත්වා ඉසිසත්තමං.

381. තදා ආමන්තයී සත්ථා ආනන්දං සුතිසාගරං;[3]
"ගච්ඡානන්ද නිවෙදෙහි භික්ඛූනං මාතුනිබ්බුතිං."

382. තද'නන්දො නිරානන්දො අස්සුනා පුණ්ණලොචනො
ගග්ගදෙන සරෙනාහ "සමාගච්ඡන්තු භික්ඛවො.

383. පුබ්බදක්ඛිණපච්ඡාසු උත්තරායං වසන්ති යෙ
සුණන්තු භාසිතං මය්හං භික්ඛවො සුගතොරසා.

384. යා වඩ්ඪයී පයත්තෙන සරීරං පච්ඡිමං මුනෙ
සා ගොතමී ගතා සන්තිං තාරාව සූරියොදයෙ.

385. බුද්ධමාතාති පඤ්ඤත්තිං ඨපයිත්වා ගතා'සමං
න යත්ථ පඤ්චනෙත්තොපි ගතිං[4] දක්ඛති නායකො

386. යස්සත්ථි සුගතෙ සද්ධා යො ච පියො[5] මහාමුනෙ.
බුද්ධමාතරි[6] සක්කාරං කරොතු සුගතොරසො."

387. සුදූරට්ඨාපි තං සුත්වා සීඝමාගඤ්ඡු භික්ඛවො
කෙචි බුද්ධානුභාවෙන කෙචි ඉද්ධීසු කොවිදා.

388. කූටාගාරවරෙ රම්මෙ සබ්බසොණ්ණමයෙ සුභෙ
මඤ්චකං සමරොපෙසුං[7] යත්ථ සුත්තාසි ගොතමී.

1. සංවිග්ගහිංසු – මජසං.
2. දීපසිඛා – සයා.
3. සුතසාගරං – මජසං.
4. ගතිං – මජසං.
5. යො වා පියෙසා – සීමු.
6. බුද්ධමාතුස්ස – මජසං.
බුද්ධස්සමාතු – සයා.
7. සමාරොපෙසුං – මජසං.

Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

377-378. එකෙණෙහි දෙවියෝ ද නාගයෝ ද අසුරයෝ ද බ්‍රහ්මයෝ ද සංවිග්න වැ (මෙසේ) කීහු: "ඒකාන්තයෙන් සංස්කාරයෝ අනිත්‍යහ. යම්සේ මෝ නිවීමට ගියා ද, එසේ ශාස්තෘ ශාසනකාරිණී වූ (-බුදුවදන් අනු වැ හැසුරුණු) යම් මෙහෙණ කෙනෙක් මැය පිරිවරා සිටියාහු ද ඕහු ද (තෙල් නැති) පහන් සිළු සෙයින් උපාදන රහිතවැ නිවීමට ගියාහු" යි.

379, "අහෝ! එක්වීම වෙන්වීම අන්තකොට ඇත්තේ යැ, අහෝ! සියලු සඞ්ඛත ධම්ම අනිත්‍ය යැ, අහෝ! ජීවිතය විනාශය කෙළවර කොට ඇත්තේ යැ" මෙසේ (ඔවුනතර) පරිදේවනා (වැලපීම්) ද ඇති වූයේ යි.

380. ඉක්බිති දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද සෘෂිශ්‍රේෂ්ඨ බුදුරදුන් කරා එළැඹැ ලෝසිරිත් අනු වැ කටයුතු දෑ කාලානුරූප කොට කෙරෙත්.

381. එකලැ ශාස්තෘන් වහන්සේ ශ්‍රැතිසාගර වූ (බොහෝ ඇසූ පිරූ තැන් ඇති) ආනන්ද තෙරණුවන් ඇමැතූ සේක: "ආනන්ද, යව, මවුගේ පිරිනිවීම භික්ෂූන්ට දන්ව" යි.

382. එවිටැ නිරානන්ද (සතුටින් තොර) ආනන්ද තෙරණුවෝ කඳුළින් පිරුණු නෙත් ඇති වැ "(ආයුෂ්මත්) මහණෙනි, එක්රැස් වෙත්වයි" ගද්ගද (පැකුලුණු) හඬින් කීහ.

383. "පෙර - දකුණු - පැසුළු - දිග්හි ද, උතුරු දිග්හි ද බුද්ධපුත්‍ර යම් භික්ෂු කෙනෙක් වෙසෙත් නම් ඔහු මගේ වචනය අසත්වා.

384. මුනීන්ද්‍රයන් වහන්සේගේ පශ්චිම ශරිරය යම් මවක් ප්‍රයත්නයෙන් වර්ධනය කළා ද, ඒ ගොතමී තොමෝ සූර්යෝදයෙහි තාරකාවක් සෙයින් ශාන්තියට ගියා යැ.

385. පසැස් ඇති නායකයන් වහන්සේ පවා යම් තෙනෙකැ ගිය ඇය නො දක්නාසේක් ද, (ඕ) 'බුද්ධමාතා' යන අසම වූ ප්‍රඥප්තිය (අප අතර) තබා (නිවීමට) ගියා යැ.

386. සුගතයන් වහන්සේ කෙරෙහි යමකුගේ ශ්‍රද්ධා ඇත් ද, මහාමුනි කෙරෙහි යමෙක් ප්‍රිය ද, (ඒ) බුද්ධ පුත්‍රතෙමේ බුද්ධමාතෘ කෙරෙහි සත්කාර කෙරේවා."

387. ඉතා දුර සිටියාවූ ද භික්ෂූහු එ අසා බුද්ධානුභාවයෙන් ඇතැම්හු ද සෘද්ධිවිෂයෙහි නිපුණ ඇතැම්හු ද වහා පැමිණියාහු යි.

388. ගෝතමී තොමෝ යම්තෙනෙකැ සැතැපී සිටියා ද ඒ මණ්ඩකය (හැඳ) සියල්ල රනින් නිම වූ ශුභ වූ රම්‍ය වූ උතුම් කූළුගෙයකැ ආරෝපණය කළහ,

Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

389. චත්තාරො ලොකපාලා තෙ අංසෙහි සමධාරයුං
සෙසා සක්කාදයො දෙවා කූටාගාරෙ සමග්ගහුං.

390. කූටාගාරානි සබ්බානි ආසුං පඤ්චසතානිපි[1]
සරදදිච්චවණ්ණානි විස්සකම්මකතානි හි.

391. සබ්බාපි තා[2] භික්ඛුනියො ආසුං මඤ්චෙසු සායිතා
දෙවානං ඛන්ධමාරූළ්හා නීයන්ති අනුපුබ්බසො.

392. සබ්බසො ඡාදිතං ආසි විතානෙන නභත්තලං
සතාරා චන්දසූරියා ලඤ්ඡිතා කනකාමයා

393. පතාකා උස්සිතා නෙකා විතතා පුප්ඵකඤ්චුකා
ඔගතාකාසපදුමා මහියා පුප්ඵමුග්ගතං.

394. දිස්සන්ති[3] චන්දසූරියා පජ්ජලන්ති ච තාරකා
මජ්ඣංගතොපි චාදිච්චො න තාපෙති සසී යථා.

395. දෙවා දිබ්බෙහි ගන්ධෙහි මාලෙහි සුරභීහි ච
වාදිතෙහි ච නච්චෙහි සඞ්ගීතීහි ච පූජයුං.

396. නාගා සුරා ච බ්‍රහ්මානො යථාසත්ති[4] යථාබලං
පූජයිංසු ච නීයන්තිං නිබ්බුතං බුද්ධමාතරං.

397. සබ්බායො පුරතො නීතා නිබ්බුතා සුගතොරසා
ගොතමී නීයතෙ පච්ඡා සක්කතා බුද්ධපොසිතා.

398. පුරතො දෙවමනුජා සනාගා'සුරබ්‍රහ්මකා
පච්ඡා සසාවකො බුද්ධො පූජත්ථං යාති මාතුයා.

399. බුද්ධස්ස පරිනිබ්බානං නෙදිසං ආසි යාදිසං
ගොතමී පරිනිබ්බානං අතිවච්ඡරියං අහු.

400. බුද්ධො බුද්ධස්ස නිබ්බානෙ[5] නොපදිස්සති[6] භික්ඛවො
බුද්ධො ගොතමීනිබ්බානෙ සාරිපුත්තාදිකා[7] තථා.

401. චිතකානි කරිත්වාන සබ්බගන්ධමයානි තෙ
ගන්ධචුණ්ණාවකිණ්ණානි ඣාපයිංසු ච තා තහිං.

1. පඤ්චසතානි හි – සිමු.
2. සබ්බා තාපි – මජසං.
3. දිස්සන්ති– මජසං,
4. යථාසත්තිං – සිමු.
5. න බුද්ධො බුද්ධනිබ්බානෙ – මජසං, PTS.
6. නොපටියාදි – මජසං.
7. සාරිපුත්තාදි – සතා.



http://www.dhammikaweb.com/

389. ඒ ලෝකපාල දෙවියෝ සිවුදෙන (කුළුගෙය) දසරුවෙහි ලා ධැරූහ. සෙසු ශක්‍රාදි දෙවියෝ කුළුගෙවල් ගත්හු.

390. කුළුගෙවල් පන්සියයක් වියැ, එ සියල්ල සරාහිරු බඳු වියැ, විස්කම්හු විසින් කරනලද වී.

391. ඒ සියලු භික්ෂුණීහු මඤ්චයන්හි ශයනය කරවන ලද වූහු. දෙවියන්ගේ දසරුවට නංවන ලද්දහු අනුපිළිවෙළින් (ආදහනස්ථානය වෙතැ) ගෙනයනු ලැබෙත්.

392. අහස්තලය හැමදෙසින් වියනින් වසනලද වියැ, තරු සහිත සඳහිරු රන්මුවා වැ ලකුණු කරන ලද වී.

393. නොයෙක් පතාකාවෝ ඔසවන ලදහ, පුෂ්පකඤ්චුකයෝ පතුරුවා හරින ලදහ, අහසෙහි පද්මයෝ එල්බුණාහ, පොළොවෙන් පුෂ්පයෝ උද්ගත වූහු.

394. සඳහිරු දක්නා ලැබෙයි, තාරකා දිලියෙයි, හිරු මධ්‍යාහ්න ගත නමුදු සඳ මෙන් (කිසිවකු) නො තවයි.

395. දෙවියෝ දිව්‍යමය ගන්ධයෙනුදු මනාසුවඳැති මල්දමිනුදු වාදනයෙනුදු නෘත්‍යයෙනුදු සංගීතියෙනුදු පිදූහු.

396. නාගයෝ ද අසුරයෝ ද බ්‍රහ්මයෝ ද පිරිනිවි (සොහොන වෙතැ) ගෙනයනු ලබන බුද්ධමාතාව ශක්ති පමණින් බල පමණින් පූජා කළෝ යි.

397. සුගතෞරස වූ පිරිනිවි සියලු මෙහෙණහු පෙරටු කොට ගෙනයන ලද්දහු ය., බුදුන් (ළදරුකල) පෝෂණය කළ ගෞතමී තොමෝ සත්කාර කරනලදුව පසුව ගෙනයනු ලබයි.

398. නාග අසුර බ්‍රහ්ම ගණයා සහිත දෙවමිනිස්හු පෙරටුව ගමන් කළහ. මවට පූජා පිණිස ශ්‍රාවකයන් සහිත වූ බුදුහු පසුවැ වැඩම කළාහු යැ.

399. ගෝතමියගේ පරිනිර්වාණය යමසේ අතිශයින් ආශ්චර්‍ය්‍ය ජනක වී ද, බුද්ධපරිනිර්වාණය එසේ ආශ්චර්‍ය්‍යජනක නො වී යැ.

400. බුද්ධපරිනිර්වාණයෙහි බුදුහු නො දක්නා ලැබෙති, ගොතමී පරිනිර්වාණයෙහි බුදුහු ද එසේ ම ශාරිපුත්‍රාදි තෙරණුවෝ ද දක්නා ලැබෙත්.

401. ඒ දෙවමිනිස්හු සුවඳ සුණු බහාලූ සියලු සුවඳ දැයින් යුතු සෑ කරවා ඔවුන් (ඒ මෙහෙණන්) එහි තැන්පත් කොට දැවූහු.



http://www.dhammikaweb.com/

402. සෙසභාගානි ඩය්හිංසු අට්ඨිසෙසානි සබ්බසො
ආනන්දො ච තදා'වොච සංවෙගජනනං වචො:

403. "ගොතමී නිධනං යාතා දඩ්ඪං වස්සා[1] සරීරකං
සඞ්කෙත'හං[2] බුද්ධනිබ්බානං න චිරෙන භවිස්සති."

404. තතො ගොතමීධාතූනි තස්සා පත්තගතානි සො
උපනාමෙසි නාථස්ස ආනන්දො බුද්ධචොදිතො.

405. පාණිනා තානි පග්ගය්හ අවොච ඉසිසත්තමො:
"මහතො සාරවන්තස්ස යථා රුක්ඛස්ස තිට්ඨතො.

406. යො සො මහත්තරො ඛන්ධො පලුජ්ජෙය්‍ය අනිච්චතා,
තථා භික්ඛුනීසඞ්ඝස්ස ගොතමී පරිනිබ්බුතා.

407. අහො අච්ඡරියං මය්හං[3] නිබ්බුතායපි මාතුයා
සරීරමත්තසෙසාය නත්ථි සොකපරිද්දවො.

408. න සොචියා පරෙසං සා තිණ්ණසංසාරසාගරා
පරිවජ්ජිතසන්තාපා සීතිභූතා සුනිබ්බුතා.

409. පණ්ඩිතාසි මහාපඤ්ඤා පුථුපඤ්ඤා තථෙව ච
රත්තඤ්ඤූ භික්ඛුනීනං සා එවං ධාරෙථ[4] භික්ඛවො.

410. ඉද්ධියා ච වසී ආසි දිබ්බාය සොතධාතුයා
චෙතොපරියඤාණස්ස වසී ආසි ච ගොතමී.

411. පුබ්බෙනිවාසං අඤ්ඤාසි දිබ්බචක්ඛු විසොධිතං
සබ්බාසවපරික්ඛීණා නත්ථි තස්සා පුනබ්භවො.

412. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ තථෙව ච
පරිසුද්ධං අහු ඤාණං තස්මා සොචනියා න සා.

413. අයොඝනහතස්සෙව ජලතො ජාතවෙදසො
අනුපුබ්බූපසන්තස්ස යථා න ඤායතෙ ගති.

414. එවං සම්මා විමුත්තානං කාමබන්ධොඝතාරිනං
පඤ්ඤාපෙතුං ගති නත්ථි පත්තානං අචලං පදං.[5]

415. අත්තදීපා තතො හොථ සතිපට්ඨානගොචරා
භාවෙත්වා සත්තබොජ්ඣඞ්ගෙ දුක්ඛස්සන්තං කරිස්සථා"ති.

ඉත්ථං සුදං මහාපජාපති ගොතමී ඉමා ගාථායො අභාසිත්ථාති.

## මහාපජාපති ගොතමී ථෙරියාපදානං සත්තමං.

1. ඩය්හාඤ්චස්සා - මජසං.
2. සඞ්කෙතං - මජසං, සයා, PTS.
3. ආනන්ද පස්ස බුද්ධස්ස - සයා.
4. ජානාථ - PTS, විඤ්ඤාථ - සයා.
5. සුඛං - සීමු, මජසං.

Free Distribution www.aathaapi.org

http://www.dhammikaweb.com/

402. අසථිධාතු ශේෂ කොට ඇති (ශරීරගත) සෙසු කොටස්හු සර්වප්‍රකාරයෙන් දැවුණාහ. එවිට අනඳ තෙරණුවෝ ද සංවේග දනවන වදන් පැවසූහ:

403. "ගොතමී නිවීමට ගියා යැ. ඇගේ සිරුර ද දැවිණ, බුද්ධ පරිනිර්වාණය නොබෝ කලකින් වෙතැයි මම සැක කරමි."

404. ඉක්බිති බුදුරදුන් විසින් මෙහෙයවන ලද ඒ අනඳ තෙරණුවෝ ගොතමී තෙරණියගේ අසථිධාතු ඇයගේ පාත්‍රගත කොට නාථ වූ බුදුරදුන්හට එළැවූහ.

405-406 ඒ අසථිධාතූන් අතින් පිළිගෙන ඍෂිශ්‍රෙෂ්ඨයන් වහන්සේ (මෙසේ) වදළ සේක: "හරඇති පවත්නා මහරුකෙක යම් ඒ ඉතා මහත්වූ කඳ යම්සේ අනිත්‍යතා හේතුයෙන් වැනසීයේ ද එසේ භික්ෂුණීසඞ්ඝයාගේ මහත්කඳ වූ ගෝතමී පිරිනිවියා යැ.

407. අහෝ! ආශ්චර්‍ය්‍යයෙකි, සිරුර පමණක් ඉතුරු කොට මව පිරිනිවිකල්හි දු මට ශෝකයෙක් පරිදේවයෙක් නැති.

408. තරණය කළ සසර සයුරු ඇති දුරු කළ සන්තාප ඇති සිහිල් වූ මොනොවට නිවුණු ඕ මෙරමා විසින් ශොක කටයුතු නො වෙයි.

409 මහණෙනි, මෙසේ ධරවු: ඕ පණ්ඩිත යැ, මහාප්‍රාඥ යැ, පුථුප්‍රාඥ (පැතුරුණු නුවණ ඇති) යැ, මෙහෙණන් අතර රාත්‍රඥ (පැවිදි වැ බොහෝකල් ඇතැ) යි.

410. ගොතමී ඍද්ධියෙහි වශී වූ යැ, දිබ්බසොතධාතුයෙහි (දිව කනෙහි) ද, චෙතොපරියඤාණයෙහි (පරසිත් දන්නා නුවණෙහි) ද වශී වූ.

411. පෙර විසූ කඳ පිළිවෙළ දතු, දිවැස පිරිසිදු කරන ලද, සියලු ආස්‍රවයෝ ගෙවී ගියහ, දැන් ඇයට පුනර්භවයෙක් නැති.

412. අර්ථ – ධර්ම – නිරුක්තියෙහි ද එසේ ම ප්‍රතිභානයෙහි ද (ඇගේ) ඥානය පිරිසිදු වියැ. එහෙයින් ඕ ශොක කටයුතු නො වෙයි.

413. යකුළින් පහළ පිළිවෙළින් නිවුණු දිලිෙයන ගින්න ගිය තැන් යම්සේ නො පැනේ ද,

414. එසේ මොනොවට (සමුච්ඡෙදප්‍රහාණ විසින් කෙලෙසුන් කෙරෙන්) මිදුණු බන්ධන සඞ්ඛ්‍යාත කාමෞඝය (හා සෙසු ඔඝ ද) තරණය කළ නිර්වාණ පදයට පැමිණි රහතුන්හට පනවන්නට (දෙව්මිනිස් ආදි) ගතියෙක් නැති.

415. එසේ හෙයින් තමා පිහිට කොට ඇති වව, සතිපට්ඨාන විෂය කොට ඇති වව. සප්තබොධ්‍යඞ්ග වඩා දුක් කෙළවර කරව "යි.

මෙසෙයින් මහාපජාපතී ගෝතමී ථෙරී ගාථා ප්‍රකාශ කළා යැ.

සත්වැනි මහාපජාපතී ගොතමී ථෙරීඅපදාන යි.



http://www.dhammikaweb.com/

# සූත්‍රාන්තපිටකයෙහි

32 වන ග්‍රන්ථය

# අපදානපාළි

දුතිය භාගය (2 කාණ්ඩය)

# ථෙරීඅපදාන

---

## මහාපජාපතිගොතමීඅපදානං

නම් ග්‍රන්ථයෙන් පිටපත් කර ( පිටු අංක 40 සිට 71 දක්වා ) Pdf- 53

යථාවබෝධය ලබනු පිණිස අවංකව වීර්යය කරන්නා වූ සියල්ලන්ට ම ධර්මාවබෝධය පිනිස ඉදිරිපත් කරමි.

**චිරං තිට්ඨතු ලෝකස්මිං සම්මාසම්බුද්ධසාසනං !**

තමහට වැඩ කැමැත්තෝ තිසරණයෙහි පිහිටත්වා ! මේ පින් අනුමෝදන් වෙත්වා !

---

**සම්පූර්ණ අපදානපාළි, භික්ඛුණී අපදානය** http://www.aathaapi.net/Thripitaka.html වෙබ් අඩවියට පිවිස 41.අපදාන පාලි භික්ඛුනී අපදාන - ඔබට ලබාගත හැක.